**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය - 2015**
**------------------------------------------------------------**

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ **2015** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය**,** හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත **2015** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපති වෙත 2016 නොවැම්බර් 21 වන දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI 1000–1810 )** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්**,** වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී**,** අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම හා අයිතිය

පෞද්ගලික අංශයේ සමාගමක් ලෙස 1979 අප්‍රේල් 13 වන දින ආරම්භ කරන ලදී. 1971 අංක 35 දරන ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පනත යටතේ 1979 ජූනි 05 දිනැති අංක 39/04 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගන්නා ලදී. එමෙන්ම රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ 1987 අංක 23 දරන සමාගම් පනතින් හා 2007 අංක 07 දරන සමාගම් පනතින් මෙම සමාගම ලියාපදිංචි කර ඇත. තවද මෙය මුළුමනින්ම රජයට අයත් සමාගමක් වන අතර එහි කොටස් හිමිකාරත්වය සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරය සතුව පවතී.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01</u>

ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් සහ වගකීම් හිළව් කළ නොහැකි වුවත් 2015 දෙසැම්බර් 31 දිනට රු.28,391,924 ක් වූ ණයගැති බැර ශේෂයක් හිලව් කර තිබීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07</u>

(i) වර්ෂය තුළදී ලැබුණු ආයෝජන පොලිය වූ රු.76,292,255 ක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවත් වර්ෂයට අදාල සම්පූර්ණ ආයෝජන පොලී ආදායම වූ රු.79,828,411 ක් ඒ යටතේ දක්වා තිබුණි.

(ii) වර්ෂය තුළ දී ආයෝජනය කරන ලද මුදල් වටිනාකම සහ ආයෝජන ආපසු ගැනීම වෙන් වෙන් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවත් ආයෝජනය කිරීම් සහ ආපසු ගැනීම් හිලව් කර ශුද්ධ ආයෝජන ආදායම ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.35,120,027 ක් පෙන්නුම් කර තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා හඳුනාගෙන තිබුණු ප්‍රතිපත්තිය අනුව වත්කමේ ජීවිත කාලය වූ වසර 08 ක් තුළ ක්‍රමක්ෂය ලෙස ප්‍රදාන ලියාහළ යුතු වුවද 2008 වර්ෂයේදී වත්කම් මිල දී ගැනීම සඳහා රාජ්‍ය ප්‍රදාන ලෙස ලැබුණු රු.31,221,094 ක් වෙනුවෙන් ඊට පටහැනි ලෙස ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු.4,977,045 ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ ලාභය රු.638,249 කින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සම්ප්‍රේෂණ කුලුනු බදු ආදායම රු.2,226,766 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර රු.5,599,348 ක් වූ ලැබිය යුතු සම්ප්‍රේෂණ කුලුනු බදු ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සම්ප්‍රේෂණ කුලුනු භාවිතය සඳහා පෞද්ගලික දුරකථන සමාගම් වෙතින් ලැබිය යුතු රු.963,054 ක් වූ විදුලි ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතු සම්ප්‍රේෂණ කුලුනු භාවිතා කිරීම වෙනුවෙන් එම සංස්ථාවට ගෙවිය යුතු රු. 2,098,686 ක් සඳහා උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඉ) සමාගමේ සේවකයෙකුට වන්දි වශයෙන් ගෙවිය යුතු ලෙස ඉකුත් වර්ෂයේදී ප්‍රතිපාදන සලස්වා තිබුණු රු.946,560 ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණු නමුත් වර්ෂය අවසාන දිනටද, එම වටිනාකම උපචිත වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී ආනයනය කරන ලද සම්ප්‍රේෂණ හා තරංග උපකරණ තොගයකට අදාළව ඇස්තමේන්තු කරන ලද පිරිවැය සහ සත්‍ය වශයෙන් ආනයනය සඳහා ගෙවන ලද මිල අතර වෙනස වූ රු.2,085,917 අදාළ ස්ථාවර වත්කම් ගිණුමට නොගලපා එය විදේශ විනිමය ලාභයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද සම්ප්‍රේෂණ හා තරංග උපකරණවල වටිනාකම රු.42,288,259 ක් වුවත් ආදායම් බදු සඳහා ප්‍රාග්ධන දීමනා ගණනය කිරීමේදී එය සදොස් ලෙස රු.46,131,106 වනසේ රු.3,842,847 ක් වැඩියෙන් ගණනය කිරීම නිසා සියයට 33 1/3 ක් වූ ප්‍රාග්ධන දීමනාව රු.1,279,245 ක් වැඩියෙන් ගණනය කර තිබුණි. මේ හේතුව නිසා වර්ෂය සඳහා ආදායම් බද්ද වෙන් කිරීම රු.358,189 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ඌ) මාස තුනකට වැඩි ආයෝජන වටිනාකම රු.545,137,461 ක් වුවත්, ඒ තුළ ඇතුළත් රු.20,464,650 ක් වූ 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොලිය, ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත නොකර කල් පිරීමට පෙර ආයෝජන මුහුණත වටිනාකමට එකතු කර මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.2,483,462,495 ක් වූ අතර එකතු කළ අගය මත බදු වාර්තාව පිළියෙල කිරිම සඳහා ආදායම රු.2,512,654,691 ක් ලෙස සැලකීම නිසා මූල්‍ය ප්‍රකාශන සහ එකතු කළ අගය මත බදු වාර්තාව අතර රු.29,192,196 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම, ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව පිළියෙල කිරිම සඳහා ආදායම රු.2,469,941,098 ලෙස සැලකීම නිසා මූල්‍ය ප්‍රකාශන සහ ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව අතර රු.13,521,397 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අගරු චෙක්පත් වටිනාකම රු. 8,891,820 ක් වූ අතර එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර එයින් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලය තුළදී අගරු වූ රු.7,039,708 ක් වටිනා චෙක්පත් සඳහා හානිකරණ ගැලපීම් සිදු කර තිබුණි.

(ආ) සමාගමේ සේවාදායකයන්ට ණය දීමේ ප්‍රතිපත්තිය අනුව මාස 03 ක කාලයක් තුළදී ණය අයකරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,113,955,478 ක් වූ සේවාදායක ණයගැතියන්ගෙන් මාස 03 සහ මාස 06 අතර ණයගැති ශේෂය රු.115,883,732 ක්ද, මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු ණයගැති ශේෂය රු.184,922,168 ක්ද, වර්ෂයකට වඩා වැඩි ණයගැති ශේෂය රු.194,041,803 ක්ද විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය රු.14,641,723 ක් වූ අතර එම ශේෂය 2004 වර්ෂයේ සිට පවතින ශේෂයක් බවත් ඒ සඳහා එකඟ වූ පරිදි සේවාවන් ලබා ගැනීමට සමාගම විසින් කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය. එසේම එම ශේෂයෙන් රු.14,623,989 ක් සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2008 ජුලි 28 දිනැති අංක පීඊඩී/**50** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2008 ජූනි 26 දිනැති අංක 14/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, **1999** ඔක්තෝබර් **08** දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | **(i)** ප්‍රවාහන හා ඉන්ධන දීමනා සඳහා හිමිකම් නොමැති නිලධාරීන් **302** දෙනෙකුට චක්‍රලේඛ නියමයන්ට පටහැනිව හා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ප්‍රවාහන හා ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.**21,**493,707 ක් ගෙවා තිබුණි.<br><br>**(ii)** තමන්ට හිමි ඉන්ධන ප්‍රමාණය ඉක්මවා ඉන්ධන ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් නිලධාරීන් දෙදෙනෙකු විසින් රු.406,656 ක් වටිනා ඉන්ධන ලීටර් 3,177 ක් එම අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ලබා ගෙන තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය | කාර්ය මණ්ඩලයේ සෑම තනතුරක් සඳහාම ඉතා පැහැදිළිව හා විස්තරාත්මකව පිළියෙල කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් තිබිය යුතු වුවත් සමාගමට එවැන්නක් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ බදු පසු ලාභය රු.433,021,231 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය රු.424,733,393 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,287,838 ක් හෙවත් සියයට 2 ක වර්ධනයක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ආදායම වැඩි වීමට සාපේක්ෂව වියදමද වැඩි වී තිබුණු නමුත් වර්ෂයේ ආදායම් බදු වියදම සියයට 28 කින් පමණ අඩු වීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණු අතර 2013 වර්ෂයට සාපේක්ෂව 2014 සහ 2015 වර්ෂවල මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2013 වර්ෂයේදී ආයතනයේ රු.1,791,757,850 ක් වූ දායකත්වය 2015 වර්ෂය වන විට රු.1,627,426,528 ක් දක්වා එනම් සියයට 9.2 කින් අඩු වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, සමාගමේ ප්‍රවෘත්ති විකාශය තුළදී සිදු වූ අපහාස කිරීම් සහ ඔවුන්ගේ චිත්‍රපට අවසරයකින් තොරව විකාශය කිරීම හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව නඩු 07 ක් පවරා තිබූ අතර වැඩ තහනම් කරන ලද සේවකයෙකු විසින් එක නඩුවක් පවරා තිබුණි. මෙම නඩු සඳහා නීතිඥ ගාස්තු වශයෙන් රු.3,105,720 ක් ගෙවා තිබුණි. බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 07 ට අදාළව ඉල්ලුම් කර තිබුණු වන්දි මුදල රු.2,564,225,000 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් ලබා දී තිබුණු ගුවන් කාලය වෙනුවෙන් අය විය යුතු රු.13,588,727 ක් අය කර ගැනීම සඳහා බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 08 ක් පවරා තිබුණු අතර එයින් නඩු 02 කට අදාළව විත්තිකරුවන්ගේ ස්ථිර පදිංචි ස්ථානයන් සොයා ගත නොහැකි වීම නිසා එම නඩු ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමෘද්ධිමත් ව්‍යවසායික සැලැස්මක් තුළ, කැප වූ සාමූහික ප්‍රයත්නය මගින්, අති නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින්, සියළු ශ්‍රී ලාංකිකයන්ගේ සාරධර්ම සුරකිමින්, පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යන පරිද්දෙන්, විශිෂ්ට කාර්යභාරයක් ඉටු කරමින් උසස් තත්ත්වයේ නිර්මාණශීලී සේවා සැපයීම සහ ශ්‍රී ලාංකික දැක්ම ලෝකය හමුවේ තැබීම සමාගමේ ප්‍රධාන අරමුණු වේ.

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යටතේ පවතින ස්වාධීන රූපවාහිනී සේවයේ පමණක් 2014 සහ 2015 වර්ෂයන්හි ලාභ ලබා තිබුණු නමුත් වසන්තම් ටීවී, වසන්තම් එෆ් එම් සහ ලක්හඬ ගුවන් විදුලියේ 2014 සහ 2015 යන වර්ෂ දෙකෙහිම අලාභයන් ලබා තිබුණි. එසේම වසන්තම් එෆ්එම් සහ ලක්හඬ ගුවන් විදුලි සේවයේ අලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු.9,009,480 ක් සහ රු.24,398,029 කින් එනම් සියයට 123 සහ සියයට 55 කින් වැඩි වී තිබුණි. වසන්තම් ටීවී හි අලාභය රු.20,245,492 ක් එනම් සියයට 69.4 කින් අඩු වී තිබුණු අතර ස්වාධීන රූපවාහිනී සේවයේ ලාභය වැඩි වී තිබුණේ රු.24,365,295 ක් එනම් සියයට 4.8 කින් පමණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

2010 අගෝස්තු සිට 2014 ජූලි මාසය දක්වා සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන ලද නිලධාරියා මාසික ප්‍රවාහන දීමනා ලෙස රු.40,000 ක් බැගින් සහ ඉන්ධන ලීටර් 140 ක් සඳහා ඉන්ධන දීමනාව ලබා ගෙන තිබියදී සමාගමේ සංචිත වාහනද පරිහරණය කර තිබුණු අතර එසේ භාවිතා කරන ලද කිලෝ මීටර් 46,237 ක් සඳහා අය විය යුතු රු.755,950 ක් අය කරගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 05 දින රාත්‍රී 07.30 න් පසුව උපලේඛනගත කරන ලද රු.8,227,333 ක් වටිනා වෙළඳ දැන්වීම් සහ අනෙකුත් වැඩසටහන් සියල්ල අවලංගු කිරීමෙන් පසු රාත්‍රී 07.30 සිට රාත්‍රී 09.50 දක්වා ජනාධිපතිවරණ ප්‍රචාරක රැලියක් සජීවීව නොමිලේ විකාශය කර තිබුණි.

(ආ) ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යටතේ පවතින අනෙකුත් මාධ්‍ය ආයතනවලට එක් ජනාධිපතිවරණ අපේක්ෂකයෙකුගේ උපලේඛනගත මැතිවරණ ප්‍රචාරණ දැන්වීම් විකාශය කිරීම සඳහා ලැබී තිබුණු රු.25,645,481 ක උපලේඛනගත දැන්වීම් සියල්ලම විකාශය නොකිරීම හේතුවෙන් රු.11,026,498 ක් අපේක්ෂකයා වෙත ආපසු ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) එක් ජනපති අපේක්ෂකයෙකු සඳහා විකාශය කිරීමට උපලේඛනගත කර මුදල් ලබා ගන්නා ලද මැතිවරණ දැන්වීම් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් විකාශය කිරීම නිසා ඒ වෙනුවෙන් අය විය යුතු රු.19,091,862 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම එම අපේක්ෂකයාගෙන් අය කර ගෙන නොතිබුණි.

(ඈ) සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ස්වාධීන රූපවාහිනී සේවය විසින් එක් අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීම සඳහා රු.101,773,058 ක් පමණ වටිනා වෙළඳ ස්වභාවයක් ගන්නා දැන්වීම් කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව පූර්ව ප්‍රචාරක පට වශයෙන් වර්ගීකරණය කර විකාශය කර තිබුණි. මීට අමතරව රේට් කාඩ් අනුව මිල නොකරන ලද තත්පර 55,317 ක කාලයකට අදාළ වෙළඳ ස්වභාවයක් ගන්නා දැන්වීම්ද පූර්ව ප්‍රචාරක පට වශයෙන් එම අපේක්ෂකයා ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් විකාශය කර තිබුණි.

## 4.4 හඳුනාගත් පාඩු

----------------

සමාගමේ සේවකයෙකු විසින් 2011 වර්ෂයේදී වංචා කරන ලද මුදලකින් තවදුරටත් ලැබිය යුතු රු.1,210,620 ක් අය කර ගැනීමෙන් තොරව සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරන ගැලපීම් සිදුකර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මඩොල්සිමා විකාශනාගාරය ඉදිකිරීම සඳහා ඉඩම ලබාගැනීමේ හැකියාව පිළිබඳ නොසලකා එහි සවිකිරීම සඳහා 2012 නොවැම්බර් 29 දින රු.5,791,748 ක් වැයකර යූ.එච්.එෆ් ඇන්ටනා පද්ධතියක් මිලදීගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර මිලදීගත් ඇන්ටනා පද්ධතියේ වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි.

මෙම ඇන්ටනා පද්ධතිය ස්ථාපිත නොකිරීම නිසා 2013 සැප්තැම්බර් සිට 2015 සැප්තැම්බර් දක්වා වූ කාලසීමාව තුළදී මඩොල්සිමා විකාශනාගාරයේ මෙහෙයුම් කටයුතු පෞද්ගලික ආයතනයකට අයත් සම්ප්‍රේෂණ උපකරණ කුලියට ගැනීම මගින් සිදු කර තිබුණු අතර ඒ සඳහා විදුලි බලය, ඇන්ටනා කුලිය සහ සම්ප්‍රේෂණාගාර කුලිය වශයෙන් පිළිවෙලින් රු.5,875,737 ක් රු.4,648,934 ක් සහ රු.2,432,640 ක් එම ආයතනයට ගෙවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම සමාගම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය, භාණ්ඩාගාරය වෙතින් අනුමත කරවාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි සේවය කරනු ලබන ස්ථිර කාර්ය මණ්ඩලය 656 ක් වූ අතර කොන්ත්‍රාත් 46 ක්, සහන 17 ක් සහ අලෙවි විධායක 32 ක් වශයෙන් සම්පූර්ණ කාර්ය මණ්ඩලය 751 ක් විය.

## 4.7 වෙළඳපොල කොටස

ප්‍රේක්ෂකයින් රූපවාහිනිය නැරඹීම සහ ගුවන් විදුලියට සවන් දීම පිළිබඳව “සීමාසහිත ලංකා වෙළඳපොල පර්යේෂණ කාර්යාංශය” (Lanka Market Research Bureau – LMRB) විසින් රූපවාහිනී නාලිකා 15 ක් සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයට අනුව 2009 වර්ෂයේදී ආයතනය සඳහා සියයට 18.8 ක්ව පැවති වෙළඳපල කොටස සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 14.4 දක්වා පහත බැස තිබුණි. ලක්හඬ ගුවන් විදුලි සේවය සඳහා 2010 වර්ෂයේදී සියයට 6.2 ක්ව පැවති වෙළඳපොල කොටස සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 01 දක්වා පහත බැස තිබුණි. එසේ වුවත් ආයතනය විසින් මෙම වෙළඳපල කොටස අඩු වීම සඳහා හේතු හඳුනාගෙන එය ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **6.5.1** වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින **60** ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 26 දිනදීය.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව 2014 සිට 2018 වර්ෂය දක්වා වූ කාලයට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඒ තුළ ඇතුළත් විය යුතු ඉතා වැදගත් කරුණු වන ආයතනයට තිබෙන සම්පත් පිළිබඳව තොරතුරු, ආයතනයේ සංවිධාන සැලැස්ම, පූර්ව වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ සමාලෝචනය ආදිය ඇතුළත් කර නොතිබුණි. තවද, එය 2015 වර්ෂය සඳහා සමාලෝචනය කර හා යාවත්කාලීන කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරිම සඳහා හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි. එසේ වුවත් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද සමහර ක්‍රියාකාරකම්ද සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

සමාගම විසින් අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණු නමුත් ඒ සඳහා විගණකාධිපතිවරයාගේ එකඟත්වය ලබාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයා වෙත වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ අඩුපාඩු | | කුලුනු බදු ආදායම් සහ වියදම් ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | ලැබිය යුතු ගිණුම් | (i) | අගරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | සේවාදායක ණය අයකර ගැනීම ප්‍රමාද වීම. |
| | | (iii) | සේවාදායකයන්ට ණය කාල සීමාව ඉක්මවා ණය ලබා දීම. |
| | | (iv) | ප්‍රතිවෙළඳ ගනුදෙණු සඳහා සේවාවන් ලබා නොගැනීම. |
| (ඇ) | නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම | | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව හා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ප්‍රවාහන දීමනා ගෙවීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරිම් පරිපාටියක් නොමැති වීම. |
| | | (ii) | කාර්ය මණ්ඩලය භාණ්ඩාගාරය වෙතින් අනුමත වී නොතිබීම. |
| (ඉ) | වෙළඳපල කොටස | | වෙළඳපල කොටස අඩුවීම පාලනය කිරිම සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම. |